# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

## නාට්‍ය හා රංගකලාව

**ග්‍රීක, රෝම සහ එලිසබතීන නාට්‍ය කලාව- DMAT 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. (අ) ග්‍රීක නාට්‍ය ප්‍රභවය වන අවධිය වන විට ග්‍රීක සමාජය තුළ ක්‍රියාත්මක වූ ආගමික විශ්වාස පද්ධතිය කුමක්දැ'යි පෙන්වා දෙන්න. (ලකුණු 04)

(ආ) ග්‍රීක නාට්‍ය කලාව ප්‍රභවය වීම සඳහා කෘෂි ආර්ථිකය සහ ඒ හා බැඳි සංස්කෘතිකාංග ඉවහල් වූයේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ඇ) ග්‍රීක රංග භූමිය සහ ග්‍රීක නාට්‍යයේ රංග ශෛලිය අතර ඇති සම්බන්ධතාව උදාහරණ සපයමින් විවරණය කරන්න. (ලකුණු 10)

02. (අ) කාව්‍යශාස්ත්‍රය කෘතියේ දැක්වෙන ට්‍රැජඩි නාට්‍යයක මූලිකාංග නම් කරන්න. (ලකුණු 03)

(ආ) ප්‍රමාද දෝෂය හෙවත් හමාටියා (Hamartia) සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ඇ) ට්‍රැජඩි වීරයාගේ බිඳවැටීම සිදු වන්නේ කෙසේදැ'යි විග්‍රහ කරන්න. ඒ සඳහා ඊඩිපස් රජ නාට්‍යයේ ඊඩිපස්ගේ චරිතය උදාහරණ වශයෙන් ගන්න. (ලකුණු 12)

03. "ඊස්කිලස් ස්වකීය ප්‍රොමිතියස් බන්ධනය නාට්‍යයේ දී 'සියුස්' ව මිත්‍රත්වයේ නීතිය ගරු නොකරන මිත්‍රත්වය, ආදරය හෝ දයානුකම්පාව නොහඳුනන කුරිරු පාලකයා ලෙස නිරූපණය කරයි." විවරණය කරන්න. (ලකුණු 20)

04. (අ) නාට්‍යකරුවෙකු වශයෙන් සොෆොක්ලීස්ගේ කාර්යභාරය අගයන්න. (ලකුණු 08)

(ආ) "ඇන්ටිගනී නාට්‍යයේ දැක්වෙන්නේ යහපත සහ අයහපත අතර ගැටුමකි". උදාහරණ දක්වමින් මෙම මතය සනාථ කරන්න. (ලකුණු 12)

05. (අ) රෝම යුගය තුළ ට්‍රැජඩි නාට්‍ය රඟ නොදක්වා කොමඩි නාට්‍ය පමණක් රඟ දැක්වීමට බල පෑ හේතු පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ආ) රෝම කොමඩි නාට්‍යයේ ලක්ෂණ ටෙරන්ස්ගේ හෝ ප්ලෝටස්ගේ නාට්‍ය ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 12)

06. මධ්‍යතන යුගයේ බිහි වූ ආගමික නාට්‍යවල ලක්ෂණ, ස්වභාවය සහ හරය පෙන්වා දෙන්න. (ලකුණු 20)

07. (අ) ෂේක්ස්පියර් විසින් රචිත ප්‍රමුඛ ට්‍රැජඩි නාට්‍ය පහක් (05) නම් කරන්න. (ලකුණු 05)

(ආ) ඉන් එක් නාට්‍යයක් තෝරාගෙන එමගින් නිරූපණය වන මධ්‍යතන යුගයේ දේශපාලන චර්යාව පෙන්වා දෙන්න. (ලකුණු 15)

08. පහත සඳහන් එක් නාට්‍ය කලාවක් මගින් ලෝක නාට්‍ය ක්ෂේත්‍රයට සිදු වූ දායකත්වය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 20)

(අ) ග්‍රීක පැරණි කොමඩි නාට්‍ය

(ආ) රෝම කොමඩි නාට්‍ය

(ඇ) ෂේක්ස්පියරියානු කොමඩි නාට්‍ය

********************************